# Abstract 22

## පුරාණ ලංකාවේ බ්‍රාහ්මණ ආගමට හිමි වූ ආස්ථානය පිළිබඳ විමසුමක්

**ජී. යූ. සී. ප්‍රනාන්දු, ඩබ්. ආර්. එච්, දර්ශනී සංචලා,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර - බෞද්ධ සංස්කෘතිය),
*udarachinthaka019@gmail.com, darshanisanchala@gmail.com*

මෙරට ප්‍රාග් බෞද්ධ යුගය තුළ මෙන් ම මහින්දාගමනයෙන් පසු ද බ්‍රාහ්මණ ආගම තිබූ බවට මූලාශ්‍රයාගත දත්ත සාක්‍ෂ්‍ය දරයි. බ්‍රාහ්මණ ආගම ලක්දිව තුළ ස්ථාපිත වීමෙන් පසු දේශපාලනික, ආගමික, සාමාජීය හා සංස්කෘතික යන සියලු අංශයන් කෙරෙහි එහි බලපෑම ලැබී තිබේ. හුදෙක් එය එක් යුගයක ලක්දිව රාජ්‍ය ආගම බවට පත් වූ බව ද කිව හැකි ය. තවත් විටක රජුන් තනන බලවේගය බවට ද පත් විය. ඒ අනුව විවිධ යුගවල දී බ්‍රාහ්මණ ආගමට ලක්දිව හිමි වූ තැන පිළිබඳ **මහාවංශ** ආදී වංශකථා පාදක කර ගනිමින් අධ්‍යයනය කෙරේ. ආගමක් වශයෙන් පමණක් නොව අධ්‍යාපනික අතින් ද ප්‍රබල තැනක් ඔවුන්ට හිමිවිය. විජය රජුගේ පටන් දෙවනපෑතිස් අවධිය දක්වා මෙන් ම එතැන් පටන් වළගම්බා රාජ සමය දක්වා ද බ්‍රාහ්මණ ආගමේ බලපෑම විද්‍යමාන විය. විටෙක බුදුදහමට ප්‍රබල අභියෝගයක් වූවා සේ ම රාජ්‍ය පාලනයට ද අභියෝගයක් විය. අන්‍ය ආගම් සහ බලවේග සමඟ ගැටෙමින් තම ස්ථානය රැක ගැනීමට ඔවුන් උත්සාහ ගෙන ඇත. මෙම ආගම අන්‍ය බලවේග සමඟ මුසු වූ අවස්ථා ද දැකගත හැකි ය. බ්‍රාහ්මණ ආගම මර්දනකාරී පිළිවෙත් මෙන් ම සහනශීලී පිළිවෙත් ද අනුගමනය කර තිබේ. එසේ ම බ්‍රාහ්මණ ආගම කෙරෙහි රජවරුන් ද එම ප්‍රතිපත්තිය ම අනුගමනය කර ඇත. **පණ්ඩුකාභය** රජ දවස සිටි **පණ්ඩුල** හා **චන්ද්‍ර** යන බමුණන් ද **දෙවනපෑතිස්** රජ දවස සිටි **තිවංක බමුණා** ද, **වළගම්බා** රජ දවස සිටි **තීය** බමුණා ද ඒ ඒ යුගවල සිටි ප්‍රබල බමුණන් ලෙස දැක්විය හැකි ය. කලින් කලට උච්චාවචනය වෙමින් දීර්ඝ කලක් ලක්දිව තුළ බ්‍රාහ්මණ ආගම පැවති බව මේ අනුව පැහැදිලි ය. හුදෙක් එය ආගමික කාර්යභාරයක් පමණක් නොව සමාජ කාර්යයන් උදෙසා ද දායකත්වය ලබා දී ඇති බව හඳුනාගත හැකි ය.

**ප්‍රමුඛ පද :** පණ්ඩුකාභය, බ්‍රාහ්මණ ආගම, මහාවංශය, මහින්දාගමනය